© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 2022/2025
## පළමු මට්ටම සෙමෙස්තරය I පරීක්ෂණය - 2024

**BDE157** | සංගීත සිද්ධාන්ත
**Music Theory**

මූලාකෘති ප්‍රශ්න පත්‍රය          කාලය : පැය තුනයි

*උපදෙස් :-*

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- I කොටසේ පිළිතුරු පත්‍රය, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටසේ සෑම පිළිතුරක් ම නව පිටුවකින් අරඹන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.

---

විභාග අංකය : ......................................

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. මානව සමාජ සංවර්ධනයට සංගීතයෙහි උපයෝගීතාව පෙන්නුම් කිරීමට පහත එක් එක් කරුණ යටතේ නිදසුන බැගින් ලියන්න.

- අධ්‍යාපන කාරකයක් ලෙස

  ..........................................................................................................................

- මනෝවිද්‍යාත්මක ප්‍රතිකර්මයක් ලෙස

  ..........................................................................................................................

- ආවේණික සංස්කෘතිකාංගයක් ලෙස

  ..........................................................................................................................

- සන්නිවේදන මාධ්‍යයක් ලෙස

  ..........................................................................................................................

- පෞරුෂ සංවර්ධනයට අත්වැලක් ලෙස

  ..........................................................................................................................

(ලකුණු 05යි)

2 පිටුව බලන්න

02. 'උසස් අධ්‍යාපන සංගීත පාඨමාලාවක ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටි අපේක්ෂකයෙකු විසින් ප්‍රශ්න තුනක් සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රාසාංගික සංගීතාංග තුනක් පහත දැක්වේ'.

- මධ්‍යලය ඛ්‍යාල් ගායනයක්
- ආසාතාත්මක ගැමි ගීයක්
- සරල ගීතයක්

(i) ඉහත සංගීතාංග තුනට ම අදාළ වන පරිදි පොදුවේ සලකා ඇගයීම් නිර්ණායක **දෙකක්** ලියන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(ලකුණු 02යි)

(ii) ඉහත සංගීතාංග අතරින් නාද විශේෂතා යටතෙහි ඛ්‍යාල් ගායනයට පමණක් අදාළ ව සුවිශේෂී ඇගයීම් නිර්ණායකයක් ගොඩනගන්න.

..........................................................................................................

(ලකුණු 01යි)

(iii) 'නිවැරදි ව හඬ අනුකරණයෙහි යෙදෙයි' යන ඇගයීම් නිර්ණායකය යොදා ගත හැකි වඩාත් ම සුදුසු සංගීතාංගය නම් කරන්න.

..........................................................................................................

(ලකුණු 01යි)

(iv) ඉහත සංගීතාංග **තුනෙහි** නාද මාලාවන්හි ස්වර හැසිරවීමේ අනන්‍ය ලක්ෂණ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

..........................................................................................................

..........................................................................................................

(ලකුණු 01යි)

*සටහන :*

- මෙම ප්‍රශ්න පත්‍රයේ I කොටස ඉහත ආකාරයේ ප්‍රශ්න අටකින් සමන්විත වේ.
- I කොටසෙහි සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 05 බැගින් ප්‍රශ්න අට සඳහා ලකුණු 40ක් හිමි වේ. (ලකුණු 05 × 8 = ලකුණු 40යි)

* *

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

**අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 2022/2025**

**පළමු මට්ටම සෙමෙස්තරය I පරීක්ෂණය - 2024**

| | |
|---|---|
| **BDE157** | **සංගීත සිද්ධාන්ත**<br>**Music Theory** |

මූලාකෘති ප්‍රශ්න පත්‍රය

## II කොටස

- ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

01\. (i) 'සංගීතය' යන්නට ඉදිරිපත් කර ඇති පිළිගත් නිර්වචන අතරින් පෙරදිග නිර්වචනයක් සහ බටහිර නිර්වචනයක් ලියන්න. (ලකුණු 02යි)

(ii) ප්‍රාසාංගික සංගීතාංගයක් සාර්ථකව ඉදිරිපත් කිරීම සඳහා රස-භාව ප්‍රකාශනය කෙරෙහි සුවිශේෂී අවධානය යොමු කළ යුතු වේ.

ඉහත අදහස සනාථ කිරීම සඳහා අදහස් ගෙන හැර දක්වන්න. (ලකුණු 05යි)

(iii) භාරතීය සංගීත විකාශනයෙහිලා මෝගල් යුගයෙන් ලද දායකත්වය, පහත කරුණු යටතේ නිදසුන් දක්වමින් ඇගයීමට ලක් කරන්න.

(අ) ගායන ශෛලීන් බිහිවීම

(ආ) වාද්‍ය භාණ්ඩ නිර්මාණය

(ඉ) සංගීත ග්‍රන්ථකරණය

(ඊ) සුවිශේෂී සංගීතඥයින් (ලකුණු 08යි)

02\. (i) (අ) බටහිර සම්භාව්‍ය සංගීත විකාශය හා සම්බන්ධයෙන්, ග්‍රීක යුගයේ සිට හඳුනාගෙන ඇති සුවිශේෂී සංධිස්ථාන **දෙකක්** නම් කර, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ආ) පරිගණක ආශ්‍රයෙන් සංගීත නිර්මාණකරණය සහ පටිගත කිරීමේ ක්‍රියාවලිය සඳහා පරිගණකය සහ මෘදුකාංග හැර බාහිරින් සම්බන්ධ කරගනු ලබන උපාංග **දෙකක්** නම් කර, ඒවා උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) පහත සඳහන් සංගීතමය කරුණු නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

(අ) නාදයේ ත්‍රිවිධ ගුණ

(ආ) ලයෙහි ප්‍රභේද තුන

(ඉ) ත්‍රිවිධ සප්තක (ලකුණු 03යි)

(iii) පෙරදිග සංගීතයෙහි සහ බටහිර සංගීතයෙහි නාදමය අනන්‍යතා ලක්ෂණ නිදසුන් සහිත ව, ධ්වනි විද්‍යාත්මකව කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 04යි)

4 පිටුව බලන්න

*සටහන :*

- මෙම පත්‍රයේ II කොටස ඉහත ආකාරයේ ප්‍රශ්න හයකින් සමන්විත වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු 15 බැගින් හිමි වේ.
- II කොටස සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ප්‍රශ්න හතරක් සඳහා ලකුණු 60ක් හිමි වේ.
  (ලකුණු 15 × 4 = ලකුණු 60යි)

* * *